UNEDITED SAMPLE PAGE

KATE ELIZABETH RUSSELL

# MY DARK VANESSA

UNEDITED SAMPLE PAGE

## පරිවර්තිකාවගේ සටහන

My Dark Vanessa මැදිවියේ ගුරුවරයෙකු හා බාලවයස්කාර සිසුවියක අතර ඇති වෙන ශෘංගාරාත්මක සම්බන්ධයක් පිළිබඳ කතාවකි. ලොව පුරා මහත් ආන්දෝලනයට ලක් වූ මෙම නවකතාව පළවී පළමු අවුරුද්ද තුළම ලොව පුරා භාෂා 27 කට පරිවර්තනය සඳහා ගිවිසුම් අත්සන් කර තිබිණ. එහි සිංහල පරිවර්තනය කරන්නට මට අවස්ථාව ලබා දුන් ත්‍රිමාණ ප්‍රකාශන ආයතනයට මගේ කෘතඥතාවය පුද කරමි. මෙම කෘතියේ වැඩකටයුතු සම්පූර්ණ කිරීමට සහය දැක්වූ මහේෂ් ගුණරත්න සොහොයුරාටත්, උත්පලා මධුවන්ති සොහොයුරියටත් ස්තුතිවන්ත වෙමි.

සෝදුපත් කියවීම කළ චන්දික අබේවික්‍රම සොහොයුරාට සහ ආකර්ෂණීය අයුරින් කවරය නිම කොට දුන් සෞම්‍ය සඳරුවන් ලියනගේ සොහොයුරාටත් බෙහෙවින්ම කෘතඥ වෙමි.

"වැනෙස්සා" ඔබ අතට එන්නේ මේ සියළුදෙනාගේ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙසටය. ඉතින් "වැනෙස්සා" ශ්‍රී ලාංකේය පාඨකයින්ට නවමු අත්දැකීමක් වනු ඇතැයි සිතමි.

"වැනෙස්සා" පිළිබඳව පාඨක ඔබගේ අදහස් දැනගන්නට බලා සිටිමි.

**නිම්මි මුදිතා හේරත්**
0718927755

UNEDITED SAMPLE PAGE



# 2017

මං වැඩට යන්න ලෑස්ති වෙන්න පටන් ගත්තා. ඒ වෙනකොටත් ඒ පෝස්ටුව දාලා පැය අටක්... මගේ කොණ්ඩෙ රැලි කරගන්න ගමන් මං ඒ පිටුව අලුත් කරලා බැලුවා.

"ශෙයාර්ස්" ගාණ 224ක්... "ලයික්" 875ක්... මං මගේ කළු ලෝම ඇඳුම ඇඳගත්තා. ඊට පස්සෙ ආයෙමත් පිටුව අලුත් කරලා බැලුවා. කවිච්චිය යට තිබුණ කළු සපත්තු දෙක අතට අරගෙන ආයෙමත් පිටුව අලුත් කළා... රත්තරන් පාටින් මගේ නම ගහලා තිබුණ හීනි තහඩු පතුර ඇඳුමේ අමුණගන්න ගමන් ආයෙමත් සැරයක් පිටුව අලුත් කරලා බැලුවා. ඒ  හැම වතාවකම ඒ පෝස්ටුවෙ බෙදා ගැනීම් ගාණයි, ඒකට ලැබුණු ප්‍රතිචාරයි ඉහළ ගිහින් තිබුණා. ඒ පෝස්ටුවට වැටෙන කොමෙන්ටු ගණන දෙගුණ තෙගුණ වෙමින් තිබුණා.

"ඔයා හරිම ශක්තිමත්."

"ඔයා හරිම නිර්භීතයි."

"දරුවෙකුට ඒ වගේ දෙයක් කරන්න පුළුවන් මොන වගේ යක්ෂයෙකුටද?"

මං මීට පැය හතරකට කලින් ස්ට්‍රෙන්ට යවපු අන්තිම කෙටි පණිවිඩය ආපහු ජංගම දුරකතන තිරය මතුපිටට ගත්තා.

"ඉතින්, ඔයා හොඳින්ද?"

එයා තාමත් ඒකට උත්තරයක් එවුවෙ නෑ. අඩු ගාණෙ එයා ඒක කියවලාවත් නෑ. මං තවත් කෙටි පණිවිඩයක් ටයිප් කළා.

"ඔයාට කතා කරන්න ඕන නම්, මං ඉන්නව..."

ඒත් ඊට පස්සෙ ආයෙමත් කල්පනා කරලා මං ඒක මකලා දැම්මා. ඊට පස්සෙ එක වචනයක්වත් නැතිව, ප්‍රශ්නාර්ථ ලකුණු පේළියක් ටයිප් කරලා යැවුවා. තවත් විනාඩි කීපයක් බලාගෙන ඉඳලා, මං එයාට ඇමතුමක් ගන්න උත්සාහ කළා. ඒත් පටිගත කරපු පණිවිඩයක් ඇහෙන්න පටන් ගත්තට පස්සෙ, මං ඒ ඇමතුම විසන්ධි කරලා ජංගම

UNEDITED SAMPLE PAGE



දුරකතනය සාක්කුවට ඔබාගෙන, මගේ අනුනිවාසයෙ දොරත් වහගෙන එළියට ආවා. ඔය තරම් මහන්සි වෙලා උත්සාහ කරන්න වුවමනාවක් නැහැනෙ. මේ අවුල ඇති කරගත්තෙ එයාමනෙ. මේක එයාගෙ ප්‍රශ්නයක් මිසක් මගේ ප්‍රශ්නයක් නෙවෙයිනෙ...

වැඩට ගියාම මං හෝටල් ආලින්දයෙ කෙළවරක තියෙන පිළිග ැනීම් මේසයට වාඩි වෙලා එතනට එන අමුත්තන්ට යන්න ඕන තැන් ගැනයි, කන්න ඕන දේවල් ගැනයි නිර්දේශ කළා. මේ ගත වෙන්නෙ හොඳටෝම කාර්යබහුල උත්සව කාලයක අන්තිම දවස් කිහිපය... ශීත කාලයට "මේන්"[1] වහලා දාන්න කලින් ගහකොළ නරඹන්න ආපු අන්තිම සංචාරකයො කීප දෙනා ඒ මේ අත යමින් හිටියා. ආචාරශීලී නමුත් ඒ තරම් මිත්‍රශීලී නැති හිනාවක් මූණෙ රඳවගෙන මං විශේෂ රෑ කෑමවේලක් සකස් කරන්න උපදෙස් දෙන්න පටන් ගත්තා. ඒ විශේෂ කෑමවේල සූදානම් කරන්නෙ තමන්ගෙ පළවෙනි විවාහ සංවත්සරය සමරන්න ලෑස්ති වෙන ජෝඩුවකට... ඒ දෙන්නා රෑ කෑමෙන් පස්සෙ ආපහු කාමරේට යනකොට ඒ කාමරේ ෂැම්පේන් බෝතලයක් තියලා තියන්නත් මං කටයුතු සූදානම් කළා. ඒක හිතනවට වඩා හොඳ ප්‍රතිඵල ලැබෙන දෙයක්. මට හොඳ සන්තෝෂමක් ලැබෙන විදිහෙ වැඩක්. ඒ අතරෙම තවත් පවුලක් "ජෙට්පෝට්"[2] එකට ඇරලවන්න වාහනයකටත් කතා කළා. සතියක් ඇර සතියක් සඳුදා රෑට හෝටලේ නවතින්න එන ව්‍යාපාරිකයෙක්, කිලිටි වෙච්ච කමිස තුනකුත් අරගෙන මගේ ළඟට ඇවිත් එක රැයකින් ඒ කමිස "ඩ්‍රයි ක්ලීන්" කරලා දෙන්න පුළුවන් තැනක් ගැන දන්නවද කියලා මගෙන් ඇහුවා.

"මං ඒක ගැන බලාගන්නම්..." මං කිවුවා.

ඒ මනුස්සයා මගේ දිහා බලලා, විරිත්තලා ඇහැක් ඉඟිමැරුවා.

"ඔයා තමයි මෙතන හොඳම කෙනා වැනෙස්සා..."

විවේක වෙලාවෙදි මං කාර්යාලයෙ පිටිපස්සෙ තියෙන හිස් කාමරයෙ වාඩි වෙලා, ජංගම දුරකතනය දිහා බලාගෙනම හෝටලයෙ තිබුණ උත්සවයකට හදලා ඉතිරි වුණු දවසක් පරණ සැන්ඩ්විච් කෑවා. අර ෆේස්බුක් පෝස්ටුව ආයෙ ආයෙමත් බලන එක දැන් මට නිතර නිතර අනිවාර්යයෙන්ම කෙරෙන දෙයක් වෙලා. මගේ ඇඟිලි ජංගම දුරකතනයෙ තිරය උඩ ඒ මේ අත යන එකත්, විනාඩියෙන් විනාඩිය වැඩි වෙන ලයික් ගණනයි, කමෙන්ටු ගණනයි බල බල මගේ ඇස් දෙක ඒ තිරයේ ඉහළ ඉඳන් පහළට ඇදෙන එකත්, මටම පාලනය කරගන්න බැරි තරම්.

1'. නව එංගලන්තයේ ප්‍රාන්තයකි.

2. ජෙට් ගුවන්යානා මෙහෙයවීම සඳහා නිර්මාණය කළ ගුවන්තොටුපොළකි.

UNEDITED SAMPLE PAGE



ඒ පෝස්ටුවට, "ඔයා නම් හරිම බය නැති කෙනෙක්...", "දිගටම ඔය විදිහට ඇත්ත කියන්න...", "මං ඔයාව විශ්වාස කරනව..." වගේ කමෙන්ටු දුසිම් ගණන් වැටිලා තිබුණා. මං ඒවා කියවන වෙලාවෙත් කොමෙන්ටු තීරුවේ අග්ගිස්සෙ තිත් තුනක් සටහන් වෙලා. ඒ කියන්නෙ මේ තත්පරේදිත් තවත් කවුරු හරි කමෙන්ටුවක් ටයිප් කරමින් ඉන්නව... ඊට පස්සෙ මායාවකින් වගේ එතනට තවත් කොමෙන්ටුවක් පහළ වෙනවා... ඒකත් අර වගේම ශක්තියත්, සහයෝගයත් ගැන කියන පණිවිඩයක්. මං ජංගම දුරකතනය මේසෙ උඩ පැත්තකට තල්ලු කරලා පිළුණු වෙච්ච සැන්ඩ්විච් පෙත්තේ ඉතිරි කොටස කුණු බාල්දියට දැම්මා.

ආපහු හෝටලේ ආලින්දය පැත්තට යන්න හදනකොටම මගේ ජංගම දුරකතනය දෙදරන්න පටන් ගත්තා. ජේකොබ් ස්ට්‍රේන්. Incoming call - Jackob Strane... ජංගම දුරකතන තිරයේ සටහන් වුණා. මං ඒ ඇමතුමට උත්තර දෙන්න පටන් ගත්තෙ හිනාවකුත් එක්කමයි. මට හිනා ගියේ එයා තාම ජීවතුන් අතර ඉන්න එක ගැනයි, එයා මට කතා කරන එක ගැනයි මට දැනුණ සතුට නිසා.

"ඔයා හොඳින්ද?"

එක මොහොතකට එතන තිබුණේ මරණීය නිශ්ශබ්දතාවයක්. ඒ තත්පර ගාණට මගේ ඇඟම අයිස් වගේ සීතල වෙලා ගල් ගැහුණා. මගේ ඇස් දෙක ජනේලයෙන් එපිට පේන සමරු චතුරස්‍රයෙ නතර වෙලා තිබුණා. සරත් සෘතුවෙ ගොවීන්ගෙ පොළයි, කෑම විකුණන ට්‍රක් රථ ටිකයි තියෙන්නේ එතන. තාම මේ ඔක්තෝබර් මාසෙ පටන් ගත්තා විතරයි. පෝට්ලන්ඩ් වල තියෙන හැම දෙයක්ම පේන්නෙ එල්.එල්. බීන්[3] සාප්පුවෙ විස්තර පත්‍රිකාවකින් එළියට ගත්ත පින්තූර වගේ... වට්ටක්කා, ලබු, ඇපල් සයිඩර් පුරවපු ජෝගු... චාම් ප්ලැනෙල් සායක් ඇඳලා, කළු බූට් සපත්තු දෙකක් දාගත්ත ගෑනු කෙනෙක්, එයාගෙ පපුවට තුරුළු කරගෙන හිටපු පුංචි දරුවත් එක්ක හිනා වෙවී චතුරස්‍රය හරහා ඇවිදගෙන ගියා.

"ස්ට්‍රේන්?"

එයා බර සුසුමක් පිට කළා.

"මං හිතුව ඔයා දකින්න ඇති කියලා."

"ඔව්..." මං කිවුවා. "මං දැක්කා..."

මං ප්‍රශ්න ඇහුවෙ නෑ. ඒත් කොහොම වුණත් එයා පැහැදිලි කරන්න පටන් ගත්තා.

3. LLBean යනු 1912 දී Leon Leonwood Bean විසින් ආරම්භ කරන ලද ඇමරිකානු පෞද්ගලික සිල්ලර වෙළෙඳ සමාගමකි.

UNEDITED SAMPLE PAGE


එයාගෙ ඉස්කෝලෙන් මේ ගැන විමර්ශනයක් කරන්න පටන් ගන්න හදනවා කියලා එයා කිවුවා. නරකම දේකට වුණත් මූණ දෙන්න එයා සූදානම් වෙමින් ඉන්න බවත් කිවුවා. ඒ ගොල්ලො එයාට අස්වෙන්න කියයි කියලා එයා හිතනවලු. මේ අවුරුද්ද ඉවර වෙනකල්වත් එයාට ඉස්කෝලෙ ඉන්න ලැබෙයිද කියලා එයාට සැකයිලු. අඩු ගාණෙ නත්තල් නිවාඩුව ඉවර වෙනකල්වත් ඉන්න පුළුවන් වෙයිද දන්නෙ නැතිලු. එයාගෙ කටහඬ අහගෙන ඉන්න එකත් මට ලොකු කම්පනයක් වගේ දැනුණා. ඒ කම්පනය කොයි තරම්ද කියනවා නම්, එයා කියන දේ ගැන අවධානය යොමු කරගෙන ඉන්නත් මට සෑහෙන උත්සාහයක් දරන්න සිද්ධ වුණා. අපි දෙන්නා අන්තිමට කතා කළේ මීට මාස ගාණකට කලින්. මගේ තාත්තා හෘදයාබාධයකින් මැරුණට පස්සෙ මට හිතින් අයින් කරගන්න බැරි විදිහේ මහා බයක් දැනුණා. ඉතින් මට තව දුරටත් ඒක කරන්න බෑ කියලා මං ස්ට්‍රේන්ට කිවුවා. වැඩ වරද්ද ගත්ත හැම වෙලාවකම, ඒ කියන්නෙ රස්සාවල් නැති කරගත්ත, සම්බන්ධකම් බිඳිලා ගිය හැම වෙලාවකම, මට ඔය වගේ හදිස්සි කල්පනාවල් පහළ වෙනව. හරියට හිටපු ගමන් හොඳ කෙනෙක් වුණාම මගේ අතින් කැඩිලා බිඳිලා යන හැම දෙයක්ම ආපහු හරි ගස්සගන්න පුළුවන් වගේ...

"ඒත් එයා ඔයාගෙ ශිෂ්‍යාවක් වෙලා හිටපු කාලෙදිම ඒ ගොල්ලො විමර්ශනයක් කළානෙ." මං කිවුවා.

"ඒ ගොල්ලො ඒක ගැන ආපහු හොයා බලනවලු. ආයෙමත් හැම කෙනෙකුගෙන්ම මුල ඉඳන් ප්‍රශ්න කරනවලු."

"ඔයා කිසි වැරැද්දක් කරලා නෑ කියලා ඒ ගොල්ලො ඒ දවස්වලම තීරණය කළා නම්, දැන් ඒ ගොල්ලො හිත වෙනස් කරගෙන තියෙන්නෙ ඇයි?"

"ළඟකදි ප්‍රවෘත්ති එහෙම බැලුවෙ නැද්ද?" එයා ඇහුවා. "දැන් අපි ජීවත් වෙන්නෙ වෙනස් කාලෙක."

එයා මේක ගැන ඕනවට වැඩිය කලබල වෙලා කියලත්, එයා අහිංසකයි නම් එයාට කිසිම ප්‍රශ්නයක් වෙන එකක් නෑ කියලත්, එයාට කියන්න මට ඕන වුණා. ඒත් එයා නිවැරදි බව මං දැනගෙන හිටියා. පහුගිය මාසෙ එක දිගටම යම් කිසි දෙයක් සිද්ධ වෙමින් තිබුණා. ගෑනු අය පිරිමින්ව, අඩන්තේට්ටම් කරන හිංසකයින් විදිහට චෝදනා කරන රැල්ලක් ඇවිත් තිබුණා. ඔය චෝදනාව වැඩිපුරම වගේ එල්ල වුණේ ගායකයො, නළුවො, දේශපාලනඥයො වගේ ප්‍රසිද්ධ අයට. ඒත් වැඩි ප්‍රසිද්ධියක් නැති අයගෙ නම් පවා ඉඳහිට කියවුණා. ඒ අයගෙ පසුබිම මොන විදිහෙ එකක් වුණත්, ඒ හැමෝටම යන්න සිද්ධ වුණේ එකම පාරක. මුලින්ම ඒ හැම කෙනෙක්ම මේ චෝදනා හැම එකක්ම ප්‍රතික්ෂේප

UNEDITED SAMPLE PAGE



කරනව. ඒත් ඊට පස්සෙ චෝදනාවල සෝෂාව තුනී වෙලා යන්නෙ නෑ කියලා ඒ ගොල්ලන්ටම පැහැදිලි වෙනව. ඒ ගොල්ලො අවමානයත් එක්ක තමන්ගේ රස්සාවලින් අයින් වෙනව. වැරදි පිළිනොගෙනම අපහැදිලි සමාව ඉල්ලීමේ ප්‍රකාශයක් නිකුත් කරනව. ඉතින් ඊට පස්සෙ, අන්තිම පියවර තමයි, ඒ ගොල්ලො නිහඬ වෙනවා. ඊටත් පස්සෙ අතුරුදහන් වෙනව.

දවසින් දවස මේ දේවල් සිද්ධ වෙන හැටි බලාගෙන ඉන්න එකත් පුදුම හිතෙන දෙයක්. මිනිස්සු හරි ලේසියෙන් කඩා වැටෙනව.

"ඒක අවුලක් නැති වෙයි." මං කිවුවා. "එයා ලියපු දේවල් ඔක්කොම බොරු."

ස්ට්‍රේන් හුස්මක් ඉහළට ඇදලාගන්න හැටිත්, එයාගෙ දත් අතර හිදැස්වලින් වාතය ඇතුළට ඇදිලා යන සද්දෙත් මට දුරකතනයෙන් ඇහුණා.

"එයා බොරු කියනවද කියල මං දන්නෙ නෑ. අඩු ගාණෙ ඒ කියන කාරණාවලට අනුව...."

"ඒත් ඔයා එයාව අල්ලලාවත් නැහැනෙ. ඒ පෝස්ට් එකේ එයා කියලා තියෙන්නෙ ඔයා එයාට අඩන්තේට්ටම් කළා කියලනෙ...."

"අඩන්තේට්ටම්..." එයා සමච්චල් හඬින් කිවුවා. "අඩන්තේට්ටම් කළා කිවුවම ඒක ඕනම දෙයක් වෙන්න පුළුවන්නෙ. ඒක හරියට... හිංසනය කියන්නෙ කෙනෙකුගෙ මැණික්කටුවෙන් තදින් අල්ලන එක වෙන්නත් පුළුවන්. එහෙම නැත්තම් කාගෙ හරි උරහිසින් අල්ලලා තල්ලු කරන එක වෙන්නත් පුළුවන්. ඒක නිසා නීතිය ඉදිරියේ ඕක කිසි තේරුමක් නැති වචනයක්."

මං ජනේලයෙන් එපිට පේන ගොවීන්ගෙ වෙළෙඳපොළ දිහාම බලාගෙන හිටියා. පාරේ එහා මෙහා යන සෙනඟ දිහා, අහස පුරා කරක් ගහන මුහුදු ලිහිණින් දිහා බලාගෙන හිටියා. කෑම විකුණමින් හිටපු ගෑනු කෙනෙක් වානේ භාජනයක පියන ඇරියා. එයා ඒ භාජනයෙන් ටමාල්[4] දෙකක් එළියට ගන්නකොට හුමාල වලාකුළකුත් ඒ භාජනෙන් එළියට පැන ගත්තා.

"ඔයා දන්නවද... එයා ගිය සතියෙ මට කතා කළා..."

තවත් නිහඬ තත්පර කීපයක් ගෙවිලා ගියා.

"එයා කතා කළාද?"

"එයාට දැනගන්න ඕන වෙලා තිබුණෙ මාත් ඉදිරිපත් වෙනවද

4. මැදට මස් පුරවා ඉරිඟු පිටියෙන් තනන ලද මෙක්සිකානු කෑම වර්ගයකි.

UNEDITED SAMPLE PAGE



කියලා. සමහර විට එයාට තේරුම් යන්න ඇති මාවත් ඒකට එකතු කර ගත්තොත් මිනිස්සු එයා කියන දේ වැඩියෙන් විශ්වාස කරයි කියලා."

ස්ට්‍රේන් මොනවත්ම කිවුවෙ නෑ.

"ඇත්තමයි... මං කිසිම උත්තරයක් දුන්නෙ නෑ...."

"හරි." එයා කිවුවා. "අනිවාර්යෙන්..."

"මං හිතුවෙ එයා බොරුවක් කරනවා කියලා. එයාට ඔච්චර ධෛර්යයක් තියෙනව කියලා හිතුවෙ නෑ."

මං ඉස්සරහට නැවිලා, ජනේලයට නළල තෙරපවා ගත්තා.

"ඕක හරියයි. මං කොයි පැත්තෙද ඉන්නෙ කියලා ඔයා දන්නවනෙ..."

මං ඒක කියනවත් එක්කම එයා හුස්මක් පිට කළා. එයාගෙ මූණෙ අස්වැසිල්ලෙන් පිරුණ හිනාවක් ඇඳෙන්න ඇති කියලා මට හිතුණා. ඒ වගේ හිනාවක් එක්ක එයාගෙ ඇස් දෙපැත්තෙ හීන් රැලි ඇඳෙන හැටි පවා මට මැවිලා පෙනුණා.

"මට අහන්න ඕන වුණේ එච්චරයි..." එයා කිවුවා.

ආපහු පිළිගැනීමේ මේසයට ගියාට පස්සෙ මං ආයෙමත් මුහුණු පොතට ගොඩ වුණා. ඊට පස්සෙ "ටයිලර් බර්ච්" කියන නම ටයිප් කළා. මුහුණු පොතේ එයාගෙ පිටුව තිරය මතුපිටට ආවා. අවුරුදු ගාණක් තිස්සෙ එයා මූණු පොතේ කාටත් බලාගන්න පුළුවන් විදිහට දාන දේවල් හැම එකක්ම වගේ මම බලනව. එයාගෙ ඡායාරූප... එයාගෙ ජීවිතේ අලුත් සිදුවීම්... ඉතින් දැන් ඒ හැම එකකටම ඉහළින් තියෙන්නෙ ස්ට්‍රේන් ගැන එයා දාපු පෝස්ටුව. ඒකෙ යටින් තියෙන ඉලක්කම් තවමත් ඉහළ යනව. දැන් ශෙයාර්ස් 458 යි. ලයික් එක්දාස් අටසිය ගාණක්. ඒ විතරක් නෙවෙයි අලුත් කමෙන්ට්ස්... ඒ හැම එකක්ම ගොඩක් දුරට සමානයි.

"මේක කාව වුණත් දිරිමත් කරන කතාවක්..."

"ඔයාගෙ ශක්තිය ගැන මට හරිම පුදුමයි..."

"ඔයා දිගටම මේ විදිහට ඇත්ත වෙනුවෙන් පෙනී ඉන්න ටයිලර්..."

ස්ට්‍රේනුයි මමයි මුලින්ම මූණ ගැහෙනකොට මගේ වයස අවුරුදු පහළොවයි. එයාට වයස අවුරුදු හතළිස් දෙකයි. අපි දෙන්න අතර පරතරය අවුරුදු තිහක් විතර වෙනව. ඒ කාලෙ මට හිතුණෙ ඒක හරි අපූරු දෙයක් කියලා... මං ඒ ගණනට පවා ආස වුණා. මගේ වයස වගේ තුන් ගුණයක්... එයාව පුරවන්න මාව තුන් ගුණයකින් වැඩි කරලා ගන්න ඕන. මට ඒක හිතින් මවාගන්න පුළුවන් වුණා. මං තුන් දෙනෙක් වුණාම... එයින් එක්කෙනෙක් එයාගෙ මොළය වටේට

UNEDITED SAMPLE PAGE



අනිත් අතින් සුබ පැතුම් පතයි අල්ලගෙන, මාරුවෙන් මාරුවට ඒ දෙක දිහා බල බලා මොහොතක් හිටියා.

"ඔයාට සුබ නත්තලක් වැනෙස්සා... ටික කාලයක ඉඳන් අපි දෙන්නා කතා කළේ නෑ තමයි. ඒත් අපේ පරණ යාළුකම ආයෙමත් ගොඩනඟා ගන්න උත්සාහ කරන්න අපට පුළුවන් වෙයි කියලා මං හිතනවා..." කියලා එයා ඒ සුබපැතුම් පතේ ලියලා තිබුණා.

"ඇයි ඔයා මෙහෙම දෙයක් කළේ?" මං ඇහුවා. "හරි විදිහට නම් අපි මේකට වියදම් කරන්න ඕන ඩොලර් දහයක් විතරයි නේද?"

දෙන්නා දෙන්නා තෑගි හුවමාරු කර ගන්නකොට, මිස් තොම්ප්සන් ඒ හැමෝම ගාවට ගියා. ගිහින් ඒ අයගෙ තෑගි ගැන තමන්ගෙ අදහස් කිව්වා. අපි දෙන්නා ගාවට ආවාම එයා, බිම වැටිලා තිබුණ ලාභ කෝපි කුඩු පැකට් එකයි, ජෙනීගෙ රතු වුණ මූණයි, මගේ මූණ පුරා පැතිරිච්ච වරදකාරී හැඟීමයි දැක්කා.

"ම්... කොච්චර අපූරු තෑග්ගක්ද!" මිස් තොම්ප්සන් කිව්වා. එයා කොච්චර උනන්දුවකින් ඒක කිව්වද කිවුවොත් මං හිතුවෙ එයා ඒ කියන්නෙ තෑගි වවුචරය ගැන කියලා. ඒත් එයා ඒ කියලා තිබුණෙ කෝපි කුඩු රාත්තල ගැන. "මම නම් කියන්නෙ, කැෆෙන් කොච්චර ගත්තත් කවදාවත් ඕනවට වඩා වැඩිවෙන්නෙ නෑ... එහෙම නේද වැනෙස්සා? ඔයාට මොනවද ලැබුණෙ?"

මං තෑගි වවුචරය එයාට පෙන්නුවා. මිස් තොම්ප්සන් යන්තමට හිනා වුණා. "ඒකත් අපූරුයි..."

"මට ගෙදර වැඩ වගයක් කරන්න තියෙනව..." ජෙනී කිව්වා. ඊට පස්සෙ එයා අල්ලන්නවත් කැමති නැති දෙයක් අරගන්නව වගේ බිම තිබුණ කෝපි කුඩු පාර්සලය ඇඟිලි දෙකකින් අල්ලලා අහුලගෙන පොදු ශාලාවෙන් පිටවෙලා ගියා. මට එයාට තවත් මොනව හරි කියන්න ඕනකම තිබුණා. එයාට ආයෙමත් මගෙත් එක්ක යාළු වෙන්න වුවමනා වුණේ ටොම් එයාත් එක්ක තිබුණ සම්බන්ධය නතර කරපු හින්දා විතරයි කියලා කෑ ගහලා කියන්න මට ඕන වුණා. ඒත් මං දැනටමත් එයාව අමතක කරලා ඉවර නිසා, එයා දැන් පරක්කු වැඩියි කියලා කියන්නත්, මං ජෙනීට හිතාගන්නවත් බැරි විදිහේ දේවල් කරනවා කියලා කියන්නත් මට ඕන වුණා.

මිස් තොම්ප්සන් මගේ දිහාට හැරුණා. "මං හිතන්නෙ ඒක හොඳට කල්පනා කරල බලලා දීපු ප්‍රයෝජනවත් තෑග්ගක් වැනෙස්සා. වැදගත් වෙන්නෙ ඔයා ඒකට කීයක් වියදම් කළාද කියන එක නෙවෙයි..."

එයා මට මෙච්චර කරුණාවන්ත වෙන්නෙ ඇයි කියලා මට තේරුණේ

UNEDITED SAMPLE PAGE


එතකොටයි. එයා හිතන්නෙ මං දුප්පත් නිසා මට ගන්න පුළුවන් වුණේ ඩොලර් තුනක කෝපි කුඩු බෑග් එකක් විතරයි කියලා වෙන්න ඇති. එයා එහෙම හිතපු එක මහ විහිළුවක්. ඒ වගේම ඒක මට අපහාසයක්. ඒත් මං එයාව නිවැරදි කරන්න ගියේ නෑ.

"මිස් තොම්ප්සන්, ඔයා මොනවද නත්තලට කරන්නෙ?" ඩියෙන්නා ඇහුවා.

"ටික කාලයකට නිව්ජර්සිවල තියෙන අපේ ගෙදර යනවා..." එයා කිවුවා. "සමහර විට යාළුවොත් එක්ක වර්මොන්ට්වලට ට්‍රිප් එකක් යන්නත් ඉඩ තියෙනව..."

"එතකොට ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ්?" ලකී ඇහුවා.

"මට එහෙම කෙනෙක් නෑනෙ..." මිස් තොම්ප්සන් එතනින් අයින් වෙලා අනිත් අයගෙ "සීක්‍රට් සැන්ටා" තෑගි බලන්න යන්න හැරුණා.

"මං හිතුවෙ මිස්ටර් ස්ට්‍රේන් එයාගෙ බෝයිෆ්‍රෙන්ඩ් වෙන්න ඇති කියලා..." ලූසි රහසින් වගේ ඩියෙන්නාට කියපු එක ඇහුණෙ නෑ වගේ, අත් දෙකත් පිටිපස්සට කරලා බැඳගෙන, මිස් තොම්ප්සන් එතනින් හෙමීට මඟ ඇරලා ගිය හැටි මං දැක්කා.

මගේ නම බිහි වෙලා තියෙන්නෙ අයිරිෂ් ජාතික ලේඛකයෙක් වුණ ජොනතන් ස්විෆ්ට්ගෙන් කියලා එක හැන්දෑවක ස්ට්‍රේන් මට කිවුවා. වතාවක් ස්විෆ්ට්, එස්තර් වැන්හොම්රිග් කියලා කාන්තාවක් ආශ්‍රය කළාලු. ඒ ගැහැනු කෙනාට කවුරුත් කතා කළේ "එස්සා" කියලාලු. "ස්විෆ්ට් ඒ ගෑනු කෙනාගෙ නම් දෙකෙන්ම කොටස් බිඳලා අරගෙන එයාට අලුත්ම නමක් හැදුවලු..." ස්ට්‍රේන් කිවුවා. "එතකොට වැන්-එස්සා කියන කොටස් දෙක එකතු වෙලා වැනෙස්සා කියන නම හැදුණාලු... ඒකෙන් තමයි ඔයාගෙ නම හැදුණෙ..."

එයාත් සමහර වෙලාවට මට කරන්නෙ ඒ ටිකම තමයි කියලා මට හිතුණත් මං ඒ ගැන වචනයක්වත් කියන්න ගියේ නෑ. එයා කරන්නෙත් මාව කොටස් වලට බිඳලා, වෙනස්ම අලුත්ම කෙනෙක් විදිහට ආයෙමත් නිර්මාණය කරන එක...

පළවෙනි වැනෙස්සා, ස්විෆ්ට් එක්ක ආදරෙන් බැඳිලා හිටපු බවත්, ඒ වැනෙස්සා ස්විෆ්ට්ට වඩා අවුරුදු විසි දෙකකින් බාලයි කියලත් ස්ට්‍රේන් මට කිවුවා. ඒ විතරක් නෙවෙයි, ස්විෆ්ට් ඒ වැනෙස්සාගේ ගුරුවරයා බවත් ස්ට්‍රේන් කිවුවා. එයාගෙ මේසෙ පිටිපස්සෙ තියෙන පොත් රාක්කය ළඟට ගිය ස්ට්‍රේන් ඒ පොත් රාක්කයෙන් ස්විෆ්ට් ලියපු "Cadenus and Vanessa" කියන කවි පොතේ පිටපතක් අතට ගත්තා. ඒක පිටු හැටක් විතර දිග කවියක්. ඒ කවිය පුරාම ලියවිලා තිබුණෙ තමන්ගෙ ගුරුවරයාට ආදරය

UNEDITED SAMPLE PAGE



කරන තරුණ ළාබාල ගෑනු ළමයෙක් ගැන. ඒ කවිය උඩින් පල්ලෙන් කියවගෙන යද්දි, මගේ හදවත වේගයෙන් ගැහෙන්න පටන් ගත්තා. ඒත් එයා මගේ දිහාම බලාගෙන ඉන්න බව මට දැනුණ හින්දා, මගේ පපුව කලබලෙන් ගැහෙන බව පිටතට නොපෙන්වා ඉන්න මං උත්සාහ කළා. මං දෙවුර අකුළලා, උදාසීන කටහඬක් මවාගෙන කතා කළා.

"මට හිතෙන්නෙ... ඒක ටිකක් හාස්‍යජනක එකක් වගේ කියලා..."

ස්ට්‍රේන් ඇහිබැම ඇකිළුවා. "මට හිතුණු විදිහට නම් ඒක හාස්‍යජනක එකක් නෙවෙයි... ටිකක් ගුප්ත, බය හිතෙන විදිහේ එකක්..." එයා ඒ පොත ආපහු රාක්කයෙ පොත් අතරට රිංගවන ගමන් ඇහෙන නෑහෙන ගාණට කියෙවුවා. "ඒක මගේ ඇඟටම කා වැදුණා. ඒක තමයි දෛවය ගැන හිතන්න පටන් ගන්න මාව පෙළඹෙවුවෙ..."

එයා එයාගෙ මේසයට ඉඳගෙන, එයාගෙ පන්ති පොතේ පිටු පෙරළන හැටි මං බලාගෙන හිටියා. එයාගෙ කන්පෙති අග රතු වෙලා. හරියට එයාට හොඳටම ලැජ්ජා හිතුණ වෙලාවක වගේ. මට එයාව ලැජ්ජාවට පත් කරන්නත් පුළුවන්කමක් තියෙනවද? එයා වුණත් අනාරක්ෂිත වෙන්න පුළුවන් කියන එක සමහර වෙලාවට මට අමතක වෙනව...

"ඔයා ඒකෙන් අදහස් කරන්නෙ මොකක්ද කියලා මං දන්නව..." මං කිවුවා.

එයා පොතෙන් ඇස් අහකට අරගෙන ඔළුව උස්සලා මගේ දිහා බැලුවා. එයාගෙ කණ්ණාඩි දෙකට ආලෝකය වැටිලා දිලිසුණා.

"මට වෙලාවකට හිතෙනව මේ හැම දෙයක්ම ඉරණමට අනුව සිද්ධ වෙන ඒවා කියලා..."

"මේ හැම දෙයක්ම..." එයාත් ඒකම කිවුවා. "ඔයා කියන්නෙ අපි දෙන්නා මේ කරන දේ ගැනද?"

මං 'ඔව්' කියලා කියන්න ඔළුව වැනුවා. "හරියට... සමහර විට මං ඉපදිලා තියෙන්නෙම මෙහෙම දෙයක් කරන්න වෙන්න ඇති..."

මගේ ඒ වචන ටික ඇහුණාම, හිනා නොවී ඉන්න උත්සාහ කරනව වගේ එයාගෙ තොල් වෙවුලන්න පටන් ගත්තා. "යන්න, ගිහින් දොර වහන්න..." එයා කිවුවා. "ලයිට්ටුත් නිවන්න..."

නත්තල් නිවාඩුවට කලින් ඉරිදා, මං ගෝල්ඩ් නේවාසිකාගාරෙ පොදු ශාලාවෙ තියෙන සල්ලි දාලා කතා කරන දුරකතනයෙන් ගෙදරට කතා කළා. බදාදා වෙනකල් බලාගෙන ඉන්නෙ නැතිව, අඟහරුවාදාම ඇවිත් මාව ගෙදර එක්කගෙන යන්න තියෙනවා නම් හොඳයි කියලා අම්මා කිවුවා. ඒ කියන්නෙ තවත් වැඩිපුර නිවාඩු දවසක්නෙ... ස්ට්‍රේන්ව

UNEDITED SAMPLE PAGE


නොදැක තවත් වැඩිපුර එක දවසක් ගත කරන්න සිද්ධ වෙනවා කියන එකනෙ... එයා නැතිව එක සති අන්තයක්වත් ඉන්න මට අමාරුයි. ඉතින් එහෙම එකේ එයා නැතිව සම්පූර්ණ සුමාන තුනක්ම මං ජීවත් වෙන්නෙ කොහොමද කියලා මට හිතාගන්නවත් බෑ. ඒ හින්දා අම්මා එහෙම කියපුවාම මට දැනුණෙ හරියට පොළොව පැලිලා මාව ගිලගන්න හදනවා වගේ...

"ඔයා මගෙන් ඇහුවෙවත් නෑනෙ... මං ඒකට කැමතිද නැද්ද කියලා මගෙන් අහන්නෙ නැතිව සම්පූර්ණ දවසක්ම කලින් මාව ඉස්කෝලෙන් අරන් යන්න තීරණය කරන්න ඔයාට බෑ..." මගේ හිතට දැනුණ බය නිසාම මට අමුතු ශක්තියක් ලැබිලා තිබුණා. මං ඇඬෙන එක පාලනය කර ගත්තේ හරිම අමාරුවෙන්. "මට වගකීම් තියනව..." මං කිවුවා. "මට කරන්න දේවල් ගොඩක් තියෙනව..."

"මොන වගේ දේවල්ද?" අම්මා ඇහුවා. "අපොයි දෙයියනේ... ඇයි ඔයා ඔය හැටි කලබල වුණේ? මොකක්ද ඒකට හේතුව?"

මම මාව පාලනය කරගන්න උත්සාහ කරමින්, නළල බිත්තියට තද කරගෙන හුස්මක් ගත්තා. "නිර්මාණාත්මක ලේඛන සංගමයෙ රැස්වීම තියනව. මට ඒක මඟ අරින්න බෑ..."

"ඔහ්..." අම්මා සුසුමක් පිට කළේ හරියට එයා මීට වඩා බැරෑරුම් දෙයක් බලාපොරොත්තුවෙන් හිටියා වගේ... "හොඳයි, මං ඔහෙට එනකොට අඩු ගාණෙ හයවත් වෙයි... එතකොට ඔයාගෙ ඔය රැස්වීමට යන්න ඔයාට වෙලාව ඇති වෙයිනෙ..."

එයා මොනවදෝ කෑමකින් කෑල්ලක් කටින් කඩා ගන්න සද්දෙත්, ඒ කෑම කෑල්ල එයාගෙ දත් අතරෙ කර කර හඬින් පොඩි වෙන සද්දෙත් මට ඇහුණා. එයා මගෙත් එක්ක කතා කරන ගමන් ඔය විදිහට කෑම කන එකට, එහෙම නැත්තම් මාත් එක්ක කතා කරන ගමන් ගෙදර අස්පස් කරන එකට, තාත්තත් එක්ක කතා කරන එකට මං කැමතිම නෑ... සමහර වෙලාවට එයා මගෙත් එක්ක කතා කරන ගමන් ජංගම දුරකතනයත් අරගෙන නාන කාමරයටත් යනවා. මං ඒක දැනගන්නෙ වැසිකිළියට වතුර ගහන සද්දෙ පසුබිමින් ඇහෙනකොට...

"ඔය සංගමයට ඔයා ඔය තරමට කැමතියි කියලා මං දැනගෙන හිටියෙ නෑනෙ..." අම්මා කිවුවා.

කිලිටි වෙලා තිබුණ මගේ කමිස අතින්ම මං නහය පිස දැම්මා. "මං ඒකට කැමති හින්දමත් නෙවෙයි... මං ඒකට යන්න ඕන කියන්නෙ මගේ වගකීම් ගැන මං බැරෑරුම්ව හිතන හින්දා..."

"හ්ම්..." කියලා එයා තවත් කෑම කෑල්ලක් හැපුවා. ඒ කෑම එයාගෙ